**ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**
---------------------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**
--------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**
---------------------

ශිර්ෂය 12- ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 29 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**
----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේදයට යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම.<br>2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.9<br>2.10 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | කාර්යභාරයන් ඉටු නොකිරීම. | 2.2.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වනු පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත නොකිරීම. | 2.8 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම. | 2.3 |
| 127(5) | කොමිෂන් සභාවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී නිලධාරිගේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.7 (ආ) |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් | පාඩු හා හානි | 2.6 |

මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේ නම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කොමිෂන් සභාවේ රැස්වීම් හා ස්ථාවර කමිටු රැස්වීම් පැවැත්වීම

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ රැස්වීම් සහ ස්ථාවර කමිටුවල රැස්වීම් වාර 12 බැගින් රැස්වීම් වාර 24 ක් පැවැත්විය යුතු වුවද කොමිෂන් සභාවේ රැස්වීම් වාර 6 ක් හා ස්ථාවර කමිටු රැස්වීම් වාර 4 ක් පමණක් පවත්වා තිබුණි.

### 2.2 කාර්යසාධනය

#### 2.2.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව විසින් ඉටු කිරීමට අපේක්ෂිත වූ ප්‍රධාන කාර්යභාරයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඒ, ඒ පළාත්වල අධ්‍යාපන පද්ධතිය සමාලෝචනය කිරීම සඳහා සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ රු.250,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ නමුත් එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 20 හා සියයට 50 ක් වී තිබුණි.

(ආ) ප්‍රතිපත්ති සම්පාදනය සඳහා භාවිතා වන අධ්‍යයනය යටතේ සිංහල අක්ෂර ලේඛනය හා භාෂා ප්‍රයෝග විධි පිළිබඳ ප්‍රමිතිය සඳහා රු.100,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම කාර්ය ඉටුකර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා කමිටු 9 ක් ස්ථාපිත කිරීම සඳහා රු.200,000 ක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් සැලැසුම් කළ පරිදි එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඈ) සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා රු.800,000 ක ප්‍රතිපාදන ඇස්තමේන්තු කර තිබුණි. මේ යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබූ දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වා නොතිබුණි.

(ඉ) ඒ, ඒ පළාත්වල අධ්‍යාපන පද්ධතිය සමාලෝචනය කිරීම සඳහා රු.250,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. පළාත්වලට අදාළ සැලසුම් 3 ක් ලබාගෙන නොතිබුණු අතර කමිටු 8 ක් දැනුවත් කිරීමේ වැඩසටහන් 8 ක් සහ සමාලෝචන රැස්වීම් 1 ක් පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් රු 198,500 ක් ඉතිරි වී තිබුණි.

**2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම වාර්තා කොමිෂන් සභාව විසින් 2018 ජූලි 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි

**2.4 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම/ චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් කොමිෂන් සභාව විසින් එම වාර්තා 2018 අගොස්තු 10 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කොමිෂන් සභාව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි.

**2.6 පාඩු හා හානි**

වෑන් රථයක් අනතුරකට ලක්වීමෙන් පසු දරන ලද අළුත්වැඩියා වෙනුවෙන් වූ රු.787,256 වැයකර තිබූ අතර රක්ෂණය මඟින් රු.586,582 ක් ලැබී තිබුණි. ඉතිරි රු.200,674 කොමිෂන් සභාවේ වාහන නඩත්තු වියදම් ලෙස සලකා කටයුතු කර තිබුණි.

**2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ කොමිෂන් සභාවට සලසා තිබුණු මූලධන ප්‍රතිපාදනය, එහි උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 27.00 | 25.24 | 1.76 | 6.52 |
| | මූලධන | 4.05 | 2.62 | 1.43 | 35.31 |
| | **එකතුව** | **31.05** | **27.86** | **3.19** | **10.27** |
| 2014 | පුනරාවර්තන | 31.58 | 28.88 | 2.70 | 8.55 |
| | මූලධන | 5.45 | 3.97 | 1.48 | 27.16 |
| | **එකතුව** | **37.03** | **32.85** | **4.18** | **11.28** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2015 | පුනරාවර්තන | 37.86 | 30.76 | 7.10 | 18.75 |
| | මූලධන | 6.20 | 1.63 | 4.57 | 73.71 |
| | **එකතුව** | **44.06** | **32.39** | **11.67** | **26.49** |
| 2016 | පුනරාවර්තන | 36.50 | 31.46 | 5.04 | 13.81 |
| | මූලධන | 4.65 | 2.18 | 2.47 | 53.12 |
| | **එකතුව** | **41.15** | **33.64** | **7.51** | **18.25** |
| 2017 | පුනරාවර්තන | 35.50 | 30.80 | 4.70 | 13.24 |
| | මූලධන | 4.15 | 2.43 | 1.72 | 41.45 |
| | **එකතුව** | **39.65** | **33.23** | **6.42** | **16.19** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 7 ක් සඳහා එකතුව රු.1,380,683 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.1,821,317 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.8 අභ්‍යන්තර විගණනය

කොමිෂන් සභාව ආරම්භක අවස්ථාවේ සිටම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

## 2.9 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජූනි 9 දිනැති අංක ඩී.එම්.ඒ./2009(1) දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂම් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 19.8 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වාර්ෂික වියදම රු. 682,681 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 07 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 11 | 03 | 08 |
| (iii) | ද්විතියික මට්ටම | 10 | 07 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | එකතුව | 45 | 29 | 16 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වූ අතිරේක ලේකම්, තනතුර අනුමත වී තිබුණද ඊට අදාළ බඳවාගැනීමේ පරිපාටිය මෙතෙක් අනුමත වී නොතිබීම මත බඳවා ගැනීම් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වූ ගණකාධිකාරී තනතුර සහ තෘතිය මට්ටමේ තනතුරක් වූ සංවර්ධන නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි අනුමත වී තිබූ නමුත් බඳවා ගැනීම් නිමකර නොතිබුණි.

**(ඇ) කාර්ය මණ්ඩලය පුහුණු කිරිම**

**--------------------------------**

කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීම අවශ්‍යවන අතර කොමිෂන් සභාව විසින් එහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් මත කාර්යමණ්ඩල පුහුණුව සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. 1,000,000 ක් වූ අතර එහි සත්‍ය වියදම රු. 736,159 ක් විය. අවම වශයෙන් වර්ෂයකට පැය 08 ක හෝ පුහුණුවක් නොලැබූ සංඛ්‍යාව 13 ක් විය.

(ii) පසුගිය වර්ෂ 5 තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණු ප්‍රමාණය සැසඳීමේදී 2014 වර්ෂයේදී ප්‍රතිපාදනයෙන් සියයට 25 ක් වී තිබූ ඉතිරිවීම් 2016 වර්ෂයේ සියයට 72 දක්වා වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී සියයට 26 දක්වා පහත වැටී තිබූ බව නිරීක්ෂණය විය.

**2.11 තිරසර සංවර්ධනය**

**-------------------**

(අ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.